## කටුවන ප්‍රාදේශීය සභාව
## හම්බන්තොට දිස්ත්‍රික්කය
-----------------------------

### 1 මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය
------

මෙම වාර්තාවේ 1.3.2 හා 1.3.6 ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉටුකළ එකතුව රු.1,472,791 ක් වූ කර්මාන්ත 2 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත දෙකක් වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.42,869 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) එකතුව රු.58,621 ක් වූ ණයගැති ශේෂ 8ක් සහ රු.102,850 ක ඉන්ධන ණයට ගැනුම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ) එකතුව රු.16,650,664 ක් වූ වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණ අතර, ඉඩම් 4 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 08 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු. 354,395 ක අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

(i) දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින රු.607,693 ක් වූ ලැබිය යුතු වීරි පහන් ආධාර, රු.4,366,901ක් වූ ජල ගාස්තු ආදායම්, රු.97,763 ක් වූ දේපල ණය පොලී සහ රු.10,000 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ii) සේවකයින් 14 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින එකතුව රු.204,085 ක ණය මුදල් සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PFD/RED/2015/08/පොදු(i) දරන 2015 ඔක්තෝබර් 09 දිනැති ලිපියේ 4.3 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

ඉකුත් වර්ෂ දෙකට අදාළ එකතුව රු.10,642,889 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය සහ 2012 හා 2014 යන වර්ෂයන්ට අදාළ එකතුව රු. 1,033,158 ක් වූ වියදම් ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.6,241,976 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් කාල විශ්ලේෂණය හා ශේෂ සනාථද, එකතුව රු.1,049,750 ක් වූ ඉඩම් සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු සහ අයිතිය තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා පරීක්ෂාකර තහවුරු කර ගැනීමට නොහැකි විය.

**1.3.7 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| | **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් සභා අරමුදලින් රු.184,784 ක වියදම් දරා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | කල් ඉකුත් වූ රු.591,910 ක තැන්පත් ශේෂ නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 4,556,232 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.4,772,301ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.216,069 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විශ්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ දෙකෙහි මෙන්ම, සමාලෝචිත වර්ෂයේදීද ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා පුනරාවර්තන වියදම්වල වැඩිවීමක් පැවතුණි.

(ආ) සභාවට ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිඳු ආකාරයකින් හැකියාව නොලැබෙන නමුත්, වියදම් අවම කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 වරිපනම් බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු ප්‍රදේශ හඳුනාගෙන නම්කර, ඒ අනුව තක්සේරු වාර්තා ලබාගෙන වරිපනම් බදු අයකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**2.3.2 බදු කුලී**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,875,076 ක් වූ හිඟ කඩකාමර කුලිය අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.3 මිද්දෙනිය සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ පළමු මහලේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර සහ දෙවන මහල ගිමන්හලක් පවත්වාගෙන යාම සඳහා බදු දීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 177 රීතිය අනුව රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර, දෙවන මහල බදු දී තිබුණි.

(ආ) බදු කාලය වසර 4 ක් ගතවී තිබුණු නමුත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය අනුව බදුකරු සමඟ ගිවිසුම්ගත වීමට 2016 අප්‍රේල් 30 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ ඡේද අංක 04 අනුව අංක 25 කඩ කාමරය වෙනුවෙන් 2016 අප්‍රේල් 30 දින දක්වාම රු. 200,000 ක් වූ එක්වන් මුදල් අයකර ගෙන නොතිබුණි.

(ඈ) දෙවන මහල සහ කඩ කාමරයක් වෙනුවෙන් මාසික තක්සේරු කුලිය පිළිවෙලින් රු.10,000 ක් හා රු. 400 ක් බැගින් මාස 25 ක් සඳහා අඩුවෙන් අය කිරීම නිසා සභාවට රු. 300,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**2.3.4 යන්ත්‍රෝපකරණ ආදායම්**

සභාවේ යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් රු. 955,026 ක මුදලක් අයවිය යුතුව තිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාළ රු.652,837 ක් හා 2013 වර්ෂයට අදාළ රු.16,400 ක් මෙම හිඟ කුලියට ඇතුළත් වී තිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.453,306 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 5,015,470 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධන ඇගයීම**

ප්‍රාග්ධන වියදම් සඳහා අයවැය ලේඛනය මගින් වැය විෂයයන් 3ක් යටතේ එකතුව රු. 1,050,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, වර්ෂය තුළ එම ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගැනීම නිසා වර්ෂය අවසානය වන විට සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**
**-----------------------------------**

අතිරික්ත මුදල් ආයෝජනය නොකිරීම
-----------------------------------------
සමාලෝචිත වර්ෂයේදී ජල ගිණුම, පොළ ගිණුම සහ මෙහෙයුම් ගිණුම තුළ පිළිවෙලින් මාසික සාමාන්‍ය රු. 1,217,299 ක්, රු. 903,390 ක් හා රු. 2,969,406 ක් සහිත අතිරික්ත මුදල් ශේෂ පැවතියද, එම මුදල් ආයෝජනය කර අතිරේක ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**
**-------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**3.3.1 මිද්දෙනිය පොළ ඉදිකිරීම**
**--------------------------**

රු. 27,489,444 ක වියදමින් ඉදිකර තිබුණු මිද්දෙනිය පොළ පිළිබඳව කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) රු. 771,948 ක් වියදමින් වැහිපීලි යොදා තිබුණද, ප්‍රමාණවත් ආධාරක කම්බි සහ වඩිම්බුව යොදා නොතිබීම නිසා වැහිපීලි නැමී හා ඇදවී තිබුණි.

(ii) ගොඩනැගිලි වල ගෙබිම ඇතැම් ස්ථාන පුපුරා තිබූ අතර, රු. 381,997 ක වියදමින් ගොඩනැගිලි වල කොටස් වෙන්කිරීම සඳහා බ්ලොක් ගල් වලින් තැනුණු බැම්වල ඉරිතැලීම් සහ පුපුරායාම් ඇති බවත් නිරීක්ෂණය විය.

(iii) සියළු උපාංග හා ආධාරක සහිතව ලීටර් 2000 ක ප්ලාස්ටික් ජල ටැංකියක් සපයා සවිකර ඇති බව දක්වමින් රු.50,000 ක මුදලක් ගෙවීම් කර තිබුණද ,පොළ භූමියෙහි ජල ටැංකියක් සවිකර නොතිබුණි.

(iv) ප්‍රජා දායකත්වයෙන් ඉටුකළ යුතු තණ පිඩලි ඇල්ලීමේ කාර්යය සඳහා රු. 121,526 ක් ගෙවීම් කර තිබූ අතර, ප්‍රජා දායකත්වය යටතේ ඉටු කළ යුතු එකතුව රු. 1,017,000 ක් වූ කාර්යයන් 7ක් 2015 ඔක්තෝම්බර් 20 දින වන විටත් ඉටුකර නොතිබුණි.

(v) 2014 සැප්තැම්බර් මාසය වන විට පොලෙහි ඉදිකිරීම් කටයුතු නිමකර සභාවට භාරදී තිබුණු නමුත්, 2016 අප්‍රේල් මස 29 දින වන විටත් එය ප්‍රයෝජනයට නොගෙන පෞද්ගලික ඉඩමක හා ප්‍රධාන මාර්ගය දෙපස පොළ පවත්වා තිබුණි.

**3.3.2 රිටිගහයාය වැව ආශ්‍රිතව වැට සකස් කිරීම සහ එහි ඇති උද්‍යානයෙහි අලංකරණ කටයුතු සිදු කිරීම**

-----------------------------------------------------------------------------------------

එකතුව රු.1,262,036 ක වියදමින් ඉටුකර තිබුණු මෙම කර්මාන්තය පිළිබඳ පරීක්ෂාවේදී පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(i) කසළ බඳුන් දෙකක් සපයා සවි කිරීම වෙනුවෙන් රු. 35,000 ක ගෙවීම් කර තිබුණු නමුත්, කසළ බඳුන් සපයා සවිකර නොතිබුණි.

(ii) මීටර් 26.82 ක් දිගට කම්බි වැටක් සකස් කිරීම සඳහා රු. 35,402 ක් ගෙවීම්කර තිබුණද, කම්බි කණු 10 ක් පමණක් සිටුවා තිබුණු අතර කම්බි වැට සකස් කර නොතිබුණි.

(iii) රු. 32,000 ක වියදමින් උද්‍යානයෙහි සවිකර තිබූ රවුම් මේසයක් හා කොන්ක්‍රීට් පුටු 4 ක් සහිත කට්ටල 4හි පුටු 16 කැඩී තිබුණි.

(iv) ඇස්තමේන්තුගත වියදමින් ලබාගත යුතු සියයට 5 ක ප්‍රජා දායකත්වය ලබා ගෙන නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ වියදම් විෂයයන් 31 ක් සඳහා සලසා තිබුණු රු.1,352,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයද, තවත් වියදම් විෂයයන 02 ක සීමාව ඉක්මවූ රු.9,104,393 ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ළගාකර නොගත් රු.5,731,714 ක් වූ ඉලක්කයන්ද නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

-------------------------

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් ඌනතා ලෙස හඳුනාගත් භාණ්ඩ වර්ග 45 කට අයත් විෂයයන් 159 ක වටිනාකම වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණු නමුත්, 2016 අප්‍රේල් 29 දින වන විටත් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**4.4 බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු. 21,099,124 ක් වූ අතර, ඊට ඉකුත් වර්ෂයට අයත් රු. 11,676,046 ක් වූ බැරකම් ඇතුළත් විය.

**5. පද්ධති හා පාලනය**

**--------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය